# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද., 2013=100) ලක්ෂ්‍යමය වෙනස මගින් ගණනය කරනු ලබන මතුපිට උද්ධමනය, 2019 වසරේ පළමු මාස අට තුළ දී පහළ තනි අගයන්හි පැවති අතර ඉන් අනතුරුව 2019 සැප්තැම්බර් මාසයේ දී පෙන්නුම් කල මැද තනි අගය කරා ළඟා විය. මේ අතර, වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය පසුගිය වසරට සාපේක්ෂව ස්ථාවර එහෙත් ඉහළ මට්ටමක පැවතුණි. නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන්වලට බොහෝ සෙයින් අනුරූප වූ ආහාර කාණ්ඩයේ මිල ගණන්, 2019 වසරේ මාර්තු මාසය දක්වා අඩුවන ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර ඉන් අනතුරුව වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. මෙම වසරේ ජනවාරි මාසයේ දී ගෙවල් කුලී මිල ගණන්වල පෙන්නුම් කළ ඉතා සැලකිය යුතු වැඩි වීමට අමතරව, වසරේ පළමු මාස නවය තුළ සිදු වූ අධ්‍යාපන ගාස්තු සහ ඉන්ධන මිල ඉහළ යෑම් හේතුවෙන් ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ද, එම කාලය තුළ ක්‍රමයෙන් ඉහළ යන ලදී. ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූප විය. 2019 වසරේ පළමු මාස අට තුළ දී විධිමත් හා අවිධිමත් යන දෙඅංශයේම නාමික වැටුප් වැඩිවීම් දක්නට ලැබුණි. රාජ්‍ය අංශයේ මූලික වැටුපට අන්තර්ග්‍රහණය කළ විශේෂ දීමනාව හා අන්තර් අතුරු දීමනාව සහ 2019 ජූලි 01 වන දින සිට හඳුන්වා දුන් විශ්‍රාම වැටුප් ගණනයේ දී සැලකිල්ලට නොගන්නා  දීමනාව හේතුවෙන් රාජ්‍ය අංශයේ සේවක වැටුප් වැඩි විය. මූර්ත වැටුප් පිළිබඳව සමස්තයක් වශයෙන් ගත් කල, අවිධිමත් අංශයේ පමණක් මූර්ත වැටුප් වැඩිවීමක් දක්නට ලැබුණු අතර රාජ්‍ය අංශයට ලබා දුන් නාමික වැටුප් වැඩිවීම් මධ්‍යයේ වුවද එම අංශයේ මූර්ත වැටුප්වල අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි විය. 2019 වසරේ පළමු භාගයේ දී සේවා වියුක්ති අනුපාතිකයේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර, තරුණයන්, කාන්තාවන් හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති පුද්ගලයන් අතර ඉහළ සේවා වියුක්ති අනුපාතිකයක් දක්නට ලැබුණි. පසුගිය වසරේ අනුරූප කාලයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගයේ දී ශ්‍රම බලකායේ සහ වැඩ කරන ජනගහනයේ සිදු වූ ඉහළ යෑම සමඟ, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. මේ අතර, වෘත්තීය කාණ්ඩයේ රැකියා සඳහා පිටත්ව යන්නන් හැර ඉතිරි සියලුම කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගේ අඩුවීමක් වාර්තා විය.

## 2019 වසරේ ප්‍රවණතා

### මිල

#### පොදු මිල මට්ටමේ විචලන

- **2019 ජනවාරි මාසයේ දී ඉහළ ගිය පොදු මිල මට්ටම, මාර්තු මාසය තෙක් පහළ යන නැඹුරුතාවක් පෙන්නුම් කර ඉන් අනතුරුව ඉහළ ගියේය.** පොදු මිල මට්ටම මනිනු ලබන පාරිභෝගික මිල දර්ශක දෙක වන, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100)[1], 2019 ජනවාරි මාසය හැරුණු විට අනෙකුත් මාසවල දී ආහාර කාණ්ඩයේ අයිතමවල මිල හා අනුරූපව විචලනය විය. ආහාර කාණ්ඩයේ අයිතමවල මිල මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල 2019 වසරේ පළමු මාස නවය තුළ දී අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාවක් වාර්තා කළේය.

- **2019 වසරේ පළමු මාස නවය තුළ දී, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල[2] මිල ප්‍රවණතාවට අනුරූප වූ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල, 2019 මාර්තු මාසය දක්වා පහළ ගොස් ඉන් පසුව ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** වසරේ පළමු කාර්තුව තුළ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිලෙහි දක්නට ලැබුණු පහළ යෑම් සඳහා ප්‍රධාන වශයෙන් එළවළු, පොල් සහ ළූණු වැනි අයිතමවල සිදු වූ මිල පහළ යෑම් සහ සහල් හා අල මිලෙහි වරින් වර සිදු වූ පහළ යෑම් හේතු විය. මේ අතර, දෙවන කාර්තුවේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිලෙහි නිරීක්ෂණය කළ ඉහළ යෑම් සඳහා එළවළු, අල, නැවුම් මත්ස්‍ය සහ ලොකු ළූණු මිලෙහි වූ ඉහළ යෑම් සමඟ රතු ළූණුවල අවස්ථා කිහිපයක දී සිදු වූ මිල ඉහළ යෑම් හේතු විය. නැවුම් මත්ස්‍ය, පලතුරු සහ ලොකු ළූණු මිලෙහි වූ ඉහළ යෑම්වල දායකත්වයෙන්, තෙවන කාර්තුවේ දී ද මෙම ඉහළ යෑම නිරීක්ෂණය කළ හැකි විය. නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට අයත් වන සහල් වර්ගවල මිල, 2019 වසරේ පළමු මාස හත තුළ දී පහළ යෑම සඳහා, හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් 2018/19 මහ කන්නයේ ලද ඉහළ වී නිෂ්පාදනය හේතු විය. කෙසේ වුවද, තෙවන කාර්තුව අවසානයේ දී අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් ඇති වූ සැපයුම් බාධා කරණ කොටගෙන සහල් මිල ඉහළ ගියේය. එමෙන්ම, හිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් පොල් නිෂ්පාදනය තවදුරටත් යථා තත්ත්වයට පත් වීමෙන්, පොල් මිල 2016 වසරේ සිට වාර්තා වූ අවම මට්ටමක පැවතුණි. සලකා බලන කාලපරිච්ඡේදයේ දී අල සහ ළූණුවල වාර්තා වූ සමස්ත මිල ඉහළ යෑම් කෙරෙහි, 2019 පෙබරවාරි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි අල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 30 කින් සහ 2019 මැයි 22 වන දින සිට බල පැවැත්වෙන පරිදි ලොකු ළූණු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 20 කින් ආනයන බදු ඉහළ දැමීම යම්තාක් දුරට හේතු විය. කෙසේ වුවද, සැප්තැම්බර් මාසයේ දී නිරීක්ෂණය කළ, ඉහළ යන ලොකු ළූණු මිලෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහා ලොකු ළූණු මත පනවා තිබූ ආනයන බද්ද කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 39 කින් 2019 ඔක්තෝබර් 03 වන දින සිට බල පැවැත්වෙන පරිදි පහළ දමන ලදී. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී නැවුම් මත්ස්‍ය මිල සමස්ත වශයෙන් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් ඇති වූ සැපයුම් බාධා ඇතැම් මාසවල දී සිදු වූ මිල ඉහළ යෑම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

- **ආහාර කාණ්ඩය තුළ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් අයිතමවල මිල 2019 වසරේ පළමු මාස නවය තුළ දී සමස්ත වශයෙන් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.** ආනයනික කිරි පිටිවල වසරකට පසු මිල සංශෝධනයක් සිදු වූ අතර, ඒ අනුව ග්‍රෑම් 400 පැකට්ටුවක මිල, 2019 මාර්තු 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් 25 කින් ඉහළ ගියේය. ලෝක වෙළඳපොළේ මිල ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, නැවතත් 2019 අගෝස්තු 02 වන දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් 5 කින් සහ 2019 සැප්තැම්බර් 24 වන දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් 20 කින් කිරිපිටි මිල දෙවතාවක දී ඉහළ නංවන ලදී. පරිප්පු සහ සීනි මිල සලකා බලන කාලසීමාව තුළ දී ස්ථාවරව පැවතුණි. තවද, 2019 ජූලි 16 වන දින සිට බල පැවැත්වෙන පරිදි, තිරිඟු පිටි කිලෝග්‍රෑමයක මිල රුපියල් 8 කින් ඉහළ නැංවුණු අතර, පාන් මිල නොවෙනස්ව පැවතුණි.

---

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද. 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද. 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල විචලන පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල විචලන පෙන්නුම් කරයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

- **2019 වසර ආරම්භයේ දී ශීඝ්‍ර ඉහළ යෑමක් වාර්තා කළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල, වසරේ පළමු මාස නවය තුළ දී අඛණ්ඩව ඉහළ ගියේය.** පාරිභෝගික මිල දර්ශක දෙකට අදාළ භාණ්ඩ පැස දෙකෙහිම ආහාර නොවන කාණ්ඩයේ විශාලතම කොටස නියෝජනය කරන නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන උප කාණ්ඩයෙහි වූ සැලකිය යුතු ඉහළ යෑම, මතුපිට උද්ධමනයෙහි සහ යටිදැරි උද්ධමනයෙහි 2019 ජනවාරි මාසයේ දී දක්නට ලැබුණු වේගවත් ඉහළ යෑමට හේතු විය. තවද, 2015 ජනවාරි මාසයට පසුව ප්‍රථම වරට ගලපන ලද, නිවාස කුලියෙහි සිදු වූ මෙම සැලකිය යුතු ඉහළ යෑම, 2019 වසර පුරාම උද්ධමන මට්ටම් ඉහළ යෑමට හේතු විය. තවද, 2018 වසරේ දී හඳුන්වා දුන් මිල සූත්‍රයට අනුව, 2019 වසරේ පළමු මාස නවය තුළ දී දේශීය ඉන්ධන මිල, සංශෝධන කිහිපයක් සමග සමස්ත වශයෙන් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. වසර ආරම්භයේ දී ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය සඳහා වන අමතර පංති ගාස්තුවල ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර පෞද්ගලික වෛද්‍ය සේවා ගාස්තු 2019 පෙබරවාරි මාසයේ දී සහ තෝරාගත් ඖෂධ සඳහා මිල 2019 මැයි මාසයේ දී ඉහළ නංවන ලදී. සිගරට් සහ මත්පැන් මත වන සුරාබදු, 2019 අයවැය මගින් සංශෝධනය වීමත් සමග, අරක්කු, බියර් සහ සිගරට් මිල මාර්තු මාසයේ දී ඉහළ යන ලදී. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, පිළියෙළ කරන ලද ආහාර අයිතම කිහිපයක මිල සහ කාර් සඳහා ගෙවනු ලබන රක්ෂණ ගාස්තු ඉහළ යෑම් වාර්තා විය. මේ අතර, 2019 සැප්තැම්බර් මාසයේ දී ජාත්‍යන්තර පාසල් ගාස්තු ඉහළ යෑම් හේතුවෙන් අධ්‍යාපන උප කාණ්ඩයෙහි මිල ඉහළ යෑම් නිරීක්ෂණය විය. තවද, 2019 ඔක්තෝබර් 05 වන දින සිට බල පැවැත්වෙන පරිදි කිලෝග්‍රෑම් 12.5 ක ගෘහස්ත එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 240 කින් පහළ දමන ලදී.


## පාරිභෝගික මිල දර්ශක

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

- **පාරිභෝගික අයිතම පැසෙහි මිල විචලන ජාතික මට්ටමින් පිළිබිඹු කරන ජා.පා.මි.ද., 2019 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවලදී පහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කර, ඉන් අනතුරුව 2019 සැප්තැම්බර් මාසය දක්වා ඉහළ ගියේය.** 2019 ජනවාරි මාසයේ දී ජා.පා.මි.ද. දර්ශක අංක 127.3 දක්වා ඉහළ යෑමට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිලෙහි ඉහළ යෑම හේතු විය. ඉන් අනතුරුව, 2019 මාර්තු මාසයේ දී ජා.පා.මි.ද. දර්ශක අංක 126.4 දක්වා පහළ ගොස්, 2019 සැප්තැම්බර් මාසයේ දර්ශක අංක 130.6 තෙක් අඛණ්ඩව ඉහළ ගියේය. පෙබරවාරි හා මාර්තු මාසවලදී නිරීක්ෂණය කළ ජා.පා.මි දර්ශකයෙහි මාසික පහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල පහළ යෑම හේතු විය. ඉන් අනතුරුව, 2019 සැප්තැම්බර් මාසය දක්වා සිදු වූ ඉහළ යෑම කෙරෙහි ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල සිදු වූ මිල වෙනස්වීම් දායක විය.

**4.1 රූප සටහන**

**මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය ජා.පා.මි.ද. (2013=100)**




මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල මිල ප්‍රවණතා මනිනු ලබන කො.පා.මි.ද., 2019 ජනවාරි මාසයේ දී දර්ශක අංක 127.4 ක් වාර්තා කර 2019 සැප්තැම්බර් මාසයේ දී දර්ශක අංක 131.1 දක්වා ළඟා විය.** ආහාර නොවන කාණ්ඩයේ මිල විචලනයත් සමග 2019 ජනවාරි මාසයේ දී ඉහළ ගිය කො.පා.මි.ද. ඉන් අනතුරුව ඇති වූ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල විචලන අනුගමනය කරමින් පෙබරවාරි සහ මාර්තු මාස දෙක තුළ දී අඛණ්ඩව පහළ ගියේය. 2019 අප්‍රේල් සිට ජූනි දක්වා නිරීක්ෂණය කළ කො.පා.මි. දර්ශකයෙහි සිදු වූ මාසික ඉහළ යෑමට ආහාර හා ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යෑම් දායක විය. කෙසේ වුවද, 2019 ජූලි මාසයේ සිදු වූ පහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල පහළ යෑම දායක විය. මේ අතර, අගෝස්තු මාසයේ දක්නට ලැබුණු මාසික ඉහළ යෑමට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ඉහළ යෑම දායක වූ අතර 2019 සැප්තැම්බර් මාසයේ සිදු වූ මාසික ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ඉහළ යෑම් දායක විය.

4


### මතුපිට උද්ධමනය

- **ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය සලකා බලනු ලබන කාලසීමාව තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යන නැඹුරුතාවක් පෙන්නුම් කළ අතර, 2019 පළමු මාස අට තුළ දී පහළ තනි අගයන්හි පැවති මතුපිට උද්ධමනය ඉන් අනතුරුව 2019 සැප්තැම්බර් මාසයේ දී පෙන්නුම් කල මැද තනි අගය කරා ළඟා විය.** වසරේ පළමු මාස නවය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනයේ වෙනස්වීමට, පසුගිය වසරේ පැවති පදනම් බලපෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මතුපිට උද්ධමනය 2019 ජනවාරි මාසයේ දී සියයට 1.2 ක් වූ අතර, සැප්තැම්බර් මාසයේ දී වසරේ මේ දක්වා පෙන්නුම් කළ ඉහළම අගය වූ සියයට 5.0 කරා ළඟා විය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ස්ථාවරව පැවති අතර, 2019 ජනවාරි මාසයේ දී එහි අගය සියයට 1.8 ක් වශයෙන් වාර්තා වූ අතර, සැප්තැම්බර් මාසයේ දී එය සියයට 2.3 ක් විය.

- **කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2019 මැයි මාසය දක්වා ඉහළ ගිය අතර, 2019 ජූලි මාසය දක්වා පහළ යන නැඹුරුතාවක් පෙන්නුම් කර, ඉන් අනතුරුව ඉහළ ගියේය.** කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය, ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 3.7 හි සිට මැයි මාසයේ දී සියයට 5.0 ක් දක්වා ඉහළ ගොස් ජූලි මාසයේ දී සියයට 3.3 දක්වා අඩු වන නැඹුරුවක් පෙන්නුම් කරමින්, නැවතත් සැප්තැම්බර් මාසයේ දී සියයට 5.0 ක් දක්වා ළඟා විය. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2019 වසරේ පළමු මාස නවය තුළ දී ස්ථාවරව පැවති අතර, ජනවාරි මාසයේ පැවති සියයට 4.1 හි සිට මැයි මාසයේ සියයට 4.2 ක් දක්වා වැඩි වී ජූනි මාසයේ දී එම අගයේම නොවෙනස්ව පැවති අතර සැප්තැම්බර් මාසයේ දී එම අගය සියයට 3.9 ක් විය.

**4.2 රූප සටහන**

**මතුපිට උද්ධමනයේ විචලන ජා.පා.මි.ද. (2013=100)**




මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


### මූලික උද්ධමනය

- **ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ස්ථාවර මට්ටමක පැවතුණ ද, පසුගිය වසරට සාපේක්ෂව ඉහළ අගයක පැවතුණි.** මෙම වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම කෙරෙහි වසර ආරම්භයේ දී නිවාස කුලී මත සිදු කළ සංශෝධන ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, මාසික වැඩිවීම් සමඟ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2019 ජනවාරි මාසයේ දී වාර්තා කළ සියයට 5.1 සිට අප්‍රේල් මාසයේ දී වාර්තා කළ සියයට 6.3 ක් දක්වා ඉහළ යන නැඹුරුතාවක් පෙන්නුම් කළ අතර, මැයි මාසයේ දී මෙම අගය නොවෙනස්ව පැවත සැප්තැම්බර් මාසයේ දී සියයට 5.6 ක් වශයෙන් වාර්තා විය. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2019 ජනවාරි මාසයේ දී සියයට 5.5 ක් වූ අතර, 2019 සැප්තැම්බර් මාසයේ දී එම අගය සියයට 5.6 ක් ලෙස වාර්තා විය.

### නිෂ්පාදක මිල උද්ධමනය

- **2019 පළමු මාස අට තුළ දී නිෂ්පාදකයාගේ මිල දර්ශකයෙහි (නි.මි.ද., 2013 සිව්වන කාර්තුව=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය, සමස්තයක් වශයෙන් පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** කෘෂිකර්මාන්ත උප අංශයේ වාර්ෂික ලක්ෂ්‍යමය නිෂ්පාදක මිල උද්ධමනය සෘණ වර්ධන වේගයක් ද, නිෂ්පාදන උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය සමස්තයක් ලෙස පහළ යන ප්‍රවණතාවක් ද, විදුලිය සහ ජල සැපයුම් උප අංශයේ නිෂ්පාදක මිල උද්ධමනය සලකා බලනු ලබන කාලපරිච්ඡේදයේ දී මිශ්‍ර විචලන සහිතව සමස්තයක් ලෙස ඉහළ යන ප්‍රවණතාවක් ද පෙන්නුම් කරන ලදී.

**4.3 රූප සටහන**
**නිෂ්පාදක මිල උද්ධමනයෙහි විචලන (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශතය)**





මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## උද්ධමන අපේක්ෂා

- ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා 2019 වසරේ පළමු මාස නවය තුළ මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, නිල මිල දර්ශක මගින් පෙන්නුම් කළ උද්ධමන ප්‍රවණතා සමඟ මනාව ගැලපුණි. කෙසේ වුවද, මෙම කාලය තුළ දී උද්ධමන අපේක්ෂා සියයට 3.5 ත් සියයට 5.0 ත් අතර පරාසයක පැවතුණි. පසුගිය වසරේ දී දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය අගය අවප්‍රමාණය වීම සහ ඉන්ධන මිලෙහි සිදු වූ වෙනස්කම් ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා ඉහළ යෑමට හේතු විය. මීට අමතරව, පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයත් සමඟ වර්ධනය වූ දේශපාලන අස්ථාවරභාවය, ව්‍යාපාර අංශයේ අනාගත උද්ධමන අපේක්ෂා ඉහළ නැංවීමට හේතු විය. මේ අතර, ව්‍යාපාර අංශයට සාපේක්ෂව උද්ධමනය පිළිබඳව දැනුම්වත්බවින් අඩු කුටුම්බ අංශයේ උද්ධමන අපේක්ෂා ව්‍යාපාර අංශයට වඩා ඉහළ අගයක පැවතුණි. අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ සිදු වූ අඩාළ වීම සහ රටෙහි පවත්නා අඩු ස්ථාවරභාවය හා වර්ධනයේ පවත්නා මන්දගාමී ස්වභාවය, කුටුම්බ අංශයේ උද්ධමන අපේක්ෂා කෙරෙහි හේතු වූ ප්‍රධාන සාධක ලෙස දක්වා තිබිණි. ඊට අමතරව, ලිහිල් කරන ලද මූල්‍ය ප්‍රතිපත්තිය සහ ඉදිරියේ දී එළැඹෙන මැතිවරණය හේතුවෙන් රජයේ වියදම් ඉහළ යෑම ව්‍යාපාර සහ කුටුම්බ යන අංශ දෙකෙහිම උද්ධමන අපේක්ෂා කෙරෙහි බලපෑම් කළ හැකි කරුණු ලෙස කැපී පෙනේ.

**4.4 රූප සටහන**
**ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා**




මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## වැටුප්


- රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 පළමු මාස අට සමඟ සැසඳීමේ දී 2019 පළමු මාස අට තුළ සියයට 2.0 කින් ඉහළ ගියේය. විශේෂ දීමනාව හා රුපියල් 10,000 ක් වූ අන්තර් අතුරු දීමනාව මූලික වැටුපට අන්තර්ග්‍රහණය කිරීම සහ 2019 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබා දුන් රුපියල් 2,500 ක නව අන්තර් අතුරු දීමනාව මේ සඳහා හේතු විය. නව අන්තර් අතුරු දීමනාව ලබා දීම හේතුවෙන් රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2019 ජූලි මාසයේ දී මාසික පදනම මත සියයට 5.0 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2019 පළමු මාස අට තුළ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 0.7 කින් පහළ යන ලදී. තවද, 2020 ජනවාරි මාසයේ දී විශේෂ දීමනාව සහ අන්තර් අතුරු දීමනාව මූලික වැටුපට අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලියෙහි අවසාන අදියරය ක්‍රියාත්මක වීමට නියමිත අතර, එමගින් රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය මාසික පදනම මත සියයට 4.9 කින් ඉහළ යනු ඇත.

- පඩි පාලක සභා මගින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 වසරේ පළමු මාස අට සමඟ සැසඳීමේ දී 2019 වසරේ පළමු මාස අට තුළ සියයට 3.4 කින් ඉහළ ගියේය.

4

**4.5 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම**




මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2018 අගෝස්තු මාසයේ දී මුද්‍රණ, රෙදිපිළි නිෂ්පාදන, ටයර් සහ ටියුබ් නිෂ්පාදනය සහ ඇඟලුම් නිෂ්පාදනය යන කර්මාන්තවල අවම වැටුප්හි සිදු වූ ඉහළ යෑම සහ 2019 වසරේ පෙබරවාරි මාසයේ දී ගඩොල් සහ උළු නිෂ්පාදනය, පොල් නිෂ්පාදනය, මේස් භාණ්ඩ නිෂ්පාදනය, ගිණි පෙට්ටි නිෂ්පාදනය සහ මෝටර් රථ ගමනාගමනය යන කර්මාන්තවල අවම වැටුප්හි සිදු වූ ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2019 වසරේ පළමු මාස අට තුළ දී විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 0.6 කින් පහළ යන ලදී. මේ අතර, 2019 වසර ආරම්භයේ දී රුපියල් 1000 ක අවම දෛනික වැටුපක් ඉල්ලා සිටිමින් වතු අංශයෙහි සේවකයන් වැඩ වර්ජනයක් ආරම්භ කළ අතර, පසුව මූලික දෛනික වැටුප රුපියල් 500 හි සිට රුපියල් 700 දක්වා ඉහළ දමන ලදී. කෙසේ වුවද, වතු අංශයේ සේවකයන්ගේ පැමිණීමේ දීමනාව සහ ඵලදායිතා දීමනාව නවතා දැමීම හේතුවෙන් දළ වැටුපෙහි ඉහළ යෑම රුපියල් 20 කට පමණක් සීමා විය.

- **අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 වසරේ පළමු මාස අට සමඟ සැසඳීමේ දී 2019 වසරේ පළමු මාස අට තුළ සියයට 7.4 කින් ඉහළ ගියේය.** 2019 වසරේ පළමු මාස අට තුළ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන සියලුම උප අංශවල සේවකයන්ගේ නාමික වැටුප් පිළිවෙළින් සියයට 11.5 කින්, සියයට 5.8 කින් සහ සියයට 7.2 කින් ඉහළ යන ලදී. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් 2018 වසරේ පළමු මාස අට සමඟ සැසඳීමේ දී 2019 වසරේ පළමු මාස අට තුළ සියයට 4.6 කින් ඉහළ යන ලදී.

## ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

- **අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු මධ්‍යයේ ශ්‍රම වෙළඳපොළ මිශ්‍ර සළකුණු පෙන්නුම් කරමින් සේවා නියුක්තිය ඉහළ ගිය අතර සේවා වියුක්ති අනුපාතය පහළ ගියේය.** 2019 වසරේ පළමු භාගය තුළ ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයේ ඉහළ යෑම හේතුකොටගෙන වැඩ කරන වයසේ ජනගහනය ඉහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනයේ පහළ යෑමක් දක්නට ලැබුණි. මේ අනුව, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. සේවා නියුක්තියේ ඉහළ යෑමක් පෙන්නුම් කළ ද 2019 වසරේ පළමු භාගය තුළ පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සේවා වියුක්ති අනුපාතයේ ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. තරුණයන්, ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලත් පුද්ගලයන් සහ ස්ත්‍රීන් අතර සේවා වියුක්තිය 2019 වසරේ පළමු භාගයේ දී ඉහළ මට්ටමක පැවතිය ද පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව එහි අඩු වීමක් දක්නට ලැබුණි.

## ශ්‍රම බලකාය

- **2018 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී ශ්‍රම බලකාය පුද්ගලයන් 260,261 කින් ඉහළ ගියේය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ යොමු කාලය තුළ, වයස අවුරුදු 15 සහ ඊට වැඩි, සේවා නියුක්ත හෝ සේවා වියුක්ත ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය ශ්‍රම බලකායට අයත් වේ. මේ අනුව ශ්‍රම බලකාය, 2018 වසරේ පළමු භාගයේ පැවති මිලියන 8.343 ට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගය තුළ දී මිලියන 8.603 දක්වා සියයට 3.1 කින් වර්ධනය විය. ශ්‍රම බලකායේ මෙම වර්ධනයට ග්‍රාමීය අංශයේ ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයේ වැඩි වීම ප්‍රධාන වශයෙන්ම හේතු වූ අතර, එය ශ්‍රම බලකායේ මුළු වැඩි වීමෙන් සියයට 83 කට දායක විය. නාගරික හා වතු අංශවල ද ශ්‍රම බලකායේ වැඩිවීමක් දක්නට

**4.1 සංඛ්‍යා සටහන**
**ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය (අ)**

| අයිතමය | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය | පුරෝකථන (වාර්ෂික) |
| කුටුම්බ ජනගහනය, '000 (වයස අවුරුදු 15 සහ ඉහළ) | 16,191 | 16,196 | 16,363 | 16,446 |
| ශ්‍රම බලකාය, '000 | 8,343 | 8,388 | 8,603 | 8,650 |
| සේවා නියුක්ත, '000 | 7,966 | 8,015 | 8,193 | 8,235 |
| සේවා වියුක්ත, '000 | 377 | 373 | 410 | 415 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 51.5 | 51.8 | 52.6 | 52.6 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 4.5 | 4.4 | 4.8 | 4.8 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ලැබුණි. සමස්තයක් ලෙස, 2018 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගය තුළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම ශ්‍රම බලකායේ වර්ධනයක් වාර්තා විය. සලකා බලන කාලය තුළ දී ස්ත්‍රී ශ්‍රම බලකාය සියයට 7.0 ක වර්ධනයක් පෙන්නුම් කළ අතර එය සමස්ත වැඩි වීමෙන් සියයට 77 ක් විය. එමෙන්ම, ග්‍රාමීය හා නාගරික අංශවල ස්ත්‍රී ශ්‍රම බලකායෙහි ද සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.


- **ශ්‍රම බලකාය සහ වැඩ කරන වයසේ ජනගහනය අතර අනුපාතය ලෙස ගණනය කරනු ලබන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2018 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 51.5 ට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 52.6 දක්වා වර්ධනය විය.** තවදුරටත් සලකා බැලීමේ දී, 2018 වසරේ පළමු භාගයේ දී සියයට 33.0 ක් ලෙස වාර්තා වූ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය හා සියයට 73.0 ක් ලෙස වාර්තා වූ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී පිළිවෙළින් සියයට 34.7 හා සියයට 73.4 දක්වා වර්ධනය විය. ඒ අනුව, ස්ත්‍රී හා පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය අතර පරතරය 2018 වසරේ පළමු භාගය තුළ පැවති සියයට 40.0 සිට 2019 වසරේ පළමු භාගයේ දී සියයට 38.7 ක් දක්වා අඩු විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී අවුරුදු 15 ත් අවුරුදු 24 ත් අතර පුද්ගලයන්ගෙන් සමන්විත තරුණ කාණ්ඩය තුළ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ ඉහළ යෑමක් වාර්තා විය.

## සේවා නියුක්තිය

- **2019 වසරේ පළමු භාගය තුළ දී සේවා නියුක්ති ජනගහනය 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුද්ගලයන් 227,238 කින් වර්ධනය විය.** ඒ අනුව, 2018 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 7.996 ක සේවා නියුක්ති ජනගහනයට සාපේක්ෂව, 2019 වසරේ පළමු භාගය තුළ සේවා නියුක්තිය මිලියන 8.193 දක්වා සියයට 2.9 කින් වර්ධනය විය. ආංශික සේවා නියුක්තිය පිළිබඳව සලකා බැලීමේ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන අංශ පිළිවෙළින් මුළු සේවා නියුක්තියෙන් සියයට 24.5, සියයට 28.3 හා සියයට 47.3 දක්වා වර්ධනය විය. මෑත කාලයේ දී සේවා නියුක්තියේ දක්නට ලැබුණු ප්‍රවණතාවලට අනුකූලව, 2019 වසරේ පළමු භාගය තුළ කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්තියේ අඩු වීමක් දක්නට ලැබුණු අතර, කර්මාන්ත හා සේවා යන අංශවල සේවා නියුක්තියේ වැඩි වීමක් දක්නට ලැබුණි.

- **2018 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සේවා නියුක්ති ජනගහනය තුළ ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ වැඩි වර්ධනයක් දක්නට ලැබුණි.** සේවා නියුක්ත ජනගහනය රැකියාවේ සේවා තත්ත්වය අනුව, වැටුප් හා වේතන ලබන්නන් (සේවා නියුක්තිකයන්) සහ ස්වයං සේවා නියුක්තිකයන් ලෙස ප්‍රධාන කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය. සේවා නියුක්තිකයන්, රාජ්‍ය අංශයේ සේවකයන් සහ පෞද්ගලික අංශයේ සේවකයන් ලෙස තවදුරටත් වර්ගීකරණය කළ හැකි අතර ස්වයං සේවා නියුක්තිකයන්, සේවා යෝජක, තමාගේම වැඩ කටයුතු කරන සහ පවුලේ ආර්ථික කටයුතුවලට දායක වන ලෙස වර්ගීකරණය කළ හැකිය. ඉහත සියලුම අංශවල සේවා නියුක්තියේ වර්ධනයක් 2019 වසරේ පළමු භාගය තුළ දක්නට ලැබුණු අතර, තමාගේම වැඩ කටයුතු කරන්නන්ගේ වර්ධනය මුළු වර්ධනයෙන් සියයට 50 කට දායක විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස ගත් කල, තමාගේම වැඩ කටයුතු කරන්නන්ගේ

**4.6 රූප සටහන**
**සමස්ත සේවා වියුක්ති අනුපාතිකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ප්‍රතිශතය ඉහළ යෑමක් ද, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිශතය පහළ යෑමක් ද දක්නට ලැබුණු අතර, සේවා යෝජක හා පවුලේ ආර්ථික කටයුතුවලට දායකවන්නන්ගේ ප්‍රතිශතය නොවෙනස්ව පැවතුණි.

- **සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සේවා වියුක්ත ජනගහනයේ පුද්ගලයන් 33,023 ක වැඩිවීමක් දක්නට ලැබුණි.** මුළු සේවා වියුක්ත ජනගහනය 2018 වසරේ පළමු භාගයේ වාර්තා වූ පුද්ගලයන් 376,984 ට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී පුද්ගලයන් 410,007 දක්වා සියයට 8.8 කින් ඉහළ ගියේය. ඒ අනුව, සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 4.5 සිට 2019 වසරේ පළමු භාගයේ දී සියයට 4.8 දක්වා ඉහළ ගියේය. සේවා වියුක්ති ජනගහනයේ මෙම ඉහළ යෑමට පුරුෂ සේවා වියුක්තියේ ඉහළ යෑම ප්‍රධාන වශයෙන්ම හේතු වූ අතර එය සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියයට 15.3 ක ඉහළ යෑමක් වාර්තා කරන ලදී. ඒ අනුව, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 3.0 සිට 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 3.4 ක් දක්වා සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ස්ත්‍රී සේවා වියුක්ත ජනගහනයේ ද සියයට 3.7 ක ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවද, ස්ත්‍රී සේවා වියුක්ත ජනගහනයේ ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ස්ත්‍රී ශ්‍රම බලකාය ඉහළ යෑම හේතුවෙන් ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 7.4 ට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 7.2 ක් දක්වා පහළ ගියේය.

**4.2 සංඛ්‍යා සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (%) - 2019 වසරේ පළමු භාගය**

| | |
|---|---|
| වයස අනුව (අවුරුදු) | |
| 15-24 | 20.8 |
| 25-29 | 10.8 |
| 30-39 | 3.1 |
| 40+ | 1.1 |
| අධ්‍යාපන මට්ටම අනුව | |
| 6-10 ශ්‍රේණි | 3.0 |
| අ.පො.ස. (සා.පෙළ) | 6.3 |
| අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ | 8.7 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **2019 වසරේ පළමු භාගය තුළ දී වයස් මට්ටම් අනුව සේවා වියුක්තියෙහි විෂමතාවය සැලකිය යුතු මට්ටමක තවදුරටත් පැවතුණි.** වයස් මට්ටම් අනුව සලකා බැලීමේ දී, අවුරුදු 30 සහ ඊට වැඩි වයස් කාණ්ඩයේ සේවා වියුක්තිය පුද්ගලයන් 22,571 කින් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර අවුරුදු 25 ත් අවුරුදු 29 ත් අතර වයස් කාණ්ඩයේ සේවා වියුක්තිය පුද්ගලයන් 8,370 කින් ඉහළ යන ලදී. පෙර වසරේ පළමු භාගය හා සැසඳීමේ දී 2019 වසරේ පළමු භාගයේ දී තරුණ[3] සේවා වියුක්තිය පුද්ගලයන් 2,081 කින් පමණක් ඉහළ යමින් අවම ඉහළ යෑම වාර්තා කරන ලදී. කෙසේ වුවද, පෙර වසරේ පළමු භාගය හා සැසඳීමේ දී 2019 වසරේ පළමු භාගය තුළ තරුණ සේවා වියුක්ති අනුපාතිකය පහළ ගිය ද එය සියයට 20.8 ක කැපී පෙනෙන ඉහළ මට්ටමක පැවතුණි.

- **අධ්‍යාපන මට්ටම අනුව සලකා බැලීමේ දී, අ.පො.ස. උසස් පෙළ සහ ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද කාණ්ඩයෙන් ඉහළම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා විය.** කෙසේ වුවද, මෙම කාණ්ඩය තුළ සේවා වියුක්ති අනුපාතිකය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 9.2 සිට 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 8.7 දක්වා පහළ ගියේය. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ පවතින කුසලතා අතර නොගැළපීම්, රැකියා සඳහා අවශ්‍ය අත්දැකීම් අඩු බව, අපේක්ෂිත සහ සැබෑ වේතන මට්ටම්වල ඇති වෙනස්කම් සහ ඇතැම් වෘත්තීන්වල පවත්නා ස්ත්‍රී පුරුෂ විෂමතාවය, ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ අගයක් ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. අ.පො.ස. සාමාන්‍ය පෙළට අඩු සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ පළමු භාගය තුළ පැවති සියයට 3.2 සිට 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 3.0 දක්වා සුළු වශයෙන්

3 වයස අවුරුදු 15-24 අතර

පහළ ගිය අතර, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ සියයට 5.0 සිට 2019 වසරේ පළමු භාගය තුළ දී සියයට 6.3 දක්වා ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ සේවා වියුක්ති ජනගහනය පිළිබඳව සලකා බැලීමේ දී, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් පුද්ගලයන් 23,303 කින් ද, අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටමට වඩා අඩු සුදුසුකම් සහිත පුද්ගලයන් 7,702 කින් ද අ.පො.ස. උසස් පෙළ සහ ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලාභී පුද්ගලයන් 2,018 කින් ද සේවා වියුක්ත ජනගහනය ඉහළ යන ලදී.


## විදේශ සේවා නියුක්තිය

- **2019 වසරේ පළමු භාගයේ දී විදේශ රැකියා සඳහා පිටව යෑම් 2018 වසරේ පළමු භාගයට සාපේක්ෂව සියයට 7.0 කින් පහළ ගියේය.** මේ සඳහා පුරුෂ කාණ්ඩයේ විදේශ රැකියා සඳහා පිටව යෑම්වල සිදු වූ සියයට 10.7 ක සැලකිය යුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් දායක වූ අතර ස්ත්‍රී කාණ්ඩයේ විදේශ රැකියා සඳහා පිටව යෑම් ද සියයට 1.0 කින් පහළ ගියේය. 2019 වසරේ පළමු භාගය තුළ දී, විදේශ රැකියා සඳහා මුළු පිටව යෑම් සංඛ්‍යාව 95,052 ක් ලෙස වාර්තා වූ අතර එයින් සියයට 59 කට පුරුෂ කාණ්ඩයත් සියයට 41 කට ස්ත්‍රී කාණ්ඩයත් දායක විය.

- **නුපුහුණු ශ්‍රමිකයන් සහ ගෘහ සේවිකාවන්, 2019 වසරේ පළමු භාගය තුළ දී විදේශ රැකියා සඳහා පිටව ගිය මුළු සංඛ්‍යාවෙන් සියයට 56 ක් නියෝජනය කරන ලදී.** පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සලකා බැලීමේ දී 2019 වසරේ පළමු භාගය තුළ දී, වෘත්තීය කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, මධ්‍යම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු ශ්‍රමික, අර්ධ පුහුණු ශ්‍රමික, නුපුහුණු ශ්‍රමික සහ ගෘහ සේවිකා කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටව යෑම් සංඛ්‍යාව පහළ ගියේය. 2019 වසරේ පළමු භාගය තුළ දී, විදේශ රැකියා සඳහා පිටව ගිය කාන්තාවන්ගෙන් සියයට 77 ක් වැනි සැලකිය යුතු ප්‍රතිශතයක්, ගෘහ සේවිකා රැකියා සඳහා පිටව ගොස් තිබුණි. පෙර වසරේ පළමු භාගය හා සලකා බලන කල, 2019 වසරේ පළමු භාගයේ දී, සියයට 4.0 ක පහළ යෑමක් පෙන්නුම් කරමින් ගෘහ සේවිකා කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටව යෑම් සංඛ්‍යාව 29,678 කරා ළඟා විය.

**4.7 රූප සටහන**

**කුසලතා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් (වසරේ පළමු භාගය තුළ)**




(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## කම්කරු සබඳතා

- **පෞද්ගලික කර්මාන්ත තුළ වැඩ වර්ජන සංඛ්‍යාව පහළ යෑමක් දැකිය හැකි වුව ද, වර්ජන සඳහා සහභාගී වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව සහ එමගින් අහිමි වූ මිනිස් දින ගණනෙහි ඉහළ යෑමක් දැකිය හැකි විය.** කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද දත්තවලට අනුව පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 2019 වසරේ පළමු භාගය තුළ දී වතු අංශය තුළ වැඩ වර්ජන සංඛ්‍යාව සහ ඒ සඳහා සහභාගී වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව පහළ යන ලද අතර, මෙම වර්ජන මගින් අහිමි වූ මිනිස් දින ගණනේ ඉහළ යෑමක් දක්නට ලැබුණි. වතු අංශය හැර අනෙකුත් අංශ තුළ 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවද, 2019 වසරේ පළමු භාගය තුළ දී වැඩ වර්ජන සඳහා සහභාගී වූ ශ්‍රමිකයන් සංඛ්‍යාව සහ එමගින් අහිමි වූ මිනිස් දින ගණන සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද දත්තවලට අනුව 2019 වසරේ පළමු භාගය තුළ දී පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන 15 ක් ද, වතු අංශයේ වැඩ වර්ජන 5 ක් ද, අනෙකුත් අංශවල වැඩ වර්ජන 10 ක් ද වාර්තා විය. සමස්තයක් ලෙස 2019 වසරේ පළමු භාගය තුළ දී ශ්‍රමිකයන් 6,646 ක් මෙම වැඩ වර්ජන සඳහා සහභාගි වූ අතර ඉන් සියයට 26 ක් වතු අංශයට ද, සියයට 74 ක් අනෙකුත් අංශවලට ද අයත් විය. මෙම වැඩ වර්ජන හේතුවෙන් 2019 වසරේ පළමු භාගය තුළ දී අහිමි වූ සමස්ත මිනිස් දින ගණන 30,696 ක් වූ අතර ඉන් සියයට 50 ක් වතු අංශයෙන් ද, සියයට 50 ක් අනෙකුත් අංශවලින් ද වාර්තා විය. පවත්නා තොරතුරු අනුව

4

මෙම වැඩවර්ජනවලට අමතරව මහජනතාවගේ දෛනික ජීවිතයට මෙන්ම රටේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම්වලට ද සෘණාත්මකව බලපාන පරිදි සෞඛ්‍ය, රේගු, තැපැල් සහ ප්‍රවාහන අංශවල ද වැඩ වර්ජන පැවතුණි.

## ශ්‍රම ඵලදායිතාව

- **වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව 2019 වසරේ පළමු භාගයේ දී වැඩ කරන ලද පැයකට රුපියල් 500.91 ක් වූ අතර, එය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ පැවති රුපියල් 494.47 ට සාපේක්ෂව සියයට 1.3 කින් ඉහළ යෑමකි.** 2019 වසරේ පළමු භාගය තුළ දී සමස්ත ශ්‍රම ඵලදායිතාව 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වර්ධනය වීම කෙරෙහි සියලු ක්‍රියාකාරකම්වල දළ එකතු කරන ලද අගයෙහි ඉහළ යෑම බලපාන ලදී. 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, කෘෂිකර්මාන්ත ක්‍රියාකාරකම්වල ශ්‍රම ඵලදායිතාවයේ ඉහළ යෑමක් සහ කර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාවයේ පහළ යෑමක් වාර්තා වූ අතර සේවා අංශයේ ශ්‍රම ඵලදායිතාව නොවෙනස්ව පැවතුණි. වඩාත් කාර්යක්ෂම ශ්‍රම සම්පත් භාවිත කරමින් ඉහළම ඵලදායිතා මට්ටමක් පෙන්නුම් කිරීමට සේවා අංශය සමත්ව ඇති අතර එය වැඩ කරන ලද පැයකට රුපියල් 600.09 ක් විය. කාර්මික අංශය තුළ එම අගය වැඩ කරන පැයකට රුපියල් 530.80 ක් ලෙස වාර්තා විය. මෑත කාලීනව ද දක්නට ලැබුණු පරිදි 2019 වසරේ පළමු භාගය තුළ පහළම ශ්‍රම ඵලදායිතාව කෘෂිකර්මාන්ත අංශයෙන් වාර්තා වූ අතර එය වැඩ කරන ලද පැයකට රුපියල් 191.61 ක් විය. කෙසේ වුවද, මෙය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ශ්‍රම ඵලදායිතාව සමග සැසඳීමේ දී සැලකිය යුතු වර්ධනයකි. මේ සඳහා කෘෂිකර්මාන්ත අංශයෙහි එකතු කළ අගයේ ඉහළ යෑම මෙන්ම එම අංශයේ වැඩ කරන ලද පැය ගණන පහළ යෑම ද හේතු විය.

## අපේක්ෂිත වර්ධන

### මිල

- **උද්ධමනය, 2019 වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ සියයට 4-6 දක්වා වූ ඉලක්කගත පරාසයේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මනාව පාලනය කෙරුණු උද්ධමන අපේක්ෂා, ඉදිරි දැක්ම මත පදනම් වූ ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ යහපත් දේශීය සැපයුම් තත්ත්ව, පොදු මිල මට්ටම හිතකර මට්ටමක පවත්වා ගෙන යෑමට උපකාර වෙතැයි අපේක්ෂා කෙරේ. එහෙත්, ජාත්‍යන්තර වෙළඳපොළේ පාරිභෝගික භාණ්ඩවල මිල ඉහළ යෑම සහ දේශීය මුදල අවප්‍රමාණය වීම වැනි සාධක, මෙම හිතකර ප්‍රවණතාවන්ට එරෙහිව යම් ප්‍රමාණයකින් මිල මත ඉහළ පීඩනයක් ඇති කිරීමට හේතු විය හැකිය. තවද, වසර අග භාගයේ දී ඇති වන ඍතුමය ඇඩි වර්ෂාපතනය හේතුවෙන් නැවුම් ආහාර අයිතමවල, විශේෂයෙන්ම, එළවළු සහ මත්ස්‍ය සැපයුම අඩාල වීම නිසා නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ මිල වෙනස්වීම, උද්ධමනය ඉහළ යෑමට හේතු විය හැකිය.

- **ප්‍රධාන වශයෙන්ම සහල්, එළවළු, පළතුරු, ළූණු සහ අල වැනි ආහාර වර්ගවල සැපයුමේ ඇති වන උච්චාවචන ඒවායේ මිලෙහි ස්ථායිතාව කෙරෙහි බලපෑම් ඇති කරන හෙයින්, සැපයුම් අතිරික්තය හා සැපයුම් හිඟය මනාව පාලනය කිරීම සඳහා ශක්තිමත් සැපයුම් කළමනාකරණ ක්‍රමවේදයක් අවශ්‍ය වේ.** අපේක්ෂිත භෝග නිෂ්පාදනයේ හිඟයන් සපුරාලීමට හැකි වන අයුරින් භෝග වගා කිරීමට ගොවියන් පෙළඹවීම සඳහා භාවිතා කළ හැකි පූර්ව දැනුම් දීමේ ක්‍රමවේදයක් සැකසීම සඳහා සාමූහිකව කටයුතු කළ යුතු වේ. එමෙන්ම අතිරික්ත භෝග නිෂ්පාදන මිලදී ගැනීම සඳහා රජය මැදිහත් වීම මගින් ගොවියාට ඇරීමට සිදුවන පාඩු අවම කළ හැක. තවද, අතරමැදියන් සහ ප්‍රවාහනයේදී සිදුවන නාස්තිය නිසා භාණ්ඩවල පාරිභෝගික හා නිෂ්පාදන මිල අතර ඇතිවන පරතරය අවම කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය හරහා මධ්‍යම ප්‍රවාහන නියෝජිත ආයතනයක් ස්ථාපනය කළ හැකිය. එමෙන්ම භෝග ප්‍රවාහනයේ දී සිදු විය හැකි නාස්තිය අවම කිරීමට උපකාරී වන මනා භෝග ඇසුරුම් ක්‍රමවේදයක් භාවිතා කිරීම කෙරෙහි ගොවීන් පෙළඹවීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ගොවීන්ට ලබා දීම ද කළ හැකිය.

## ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

- **සීඝ්‍රයෙන් සිදු වෙමින් පවතින සිව්වන කාර්මික විප්ලවයත් සමග රැකියා අපේක්ෂකයන්ගේ කුසලතා හා සේවා යෝජකයන්ගේ අවශ්‍යතා අතර දැනට පවතින හා වර්ධනය වෙමින් පවතින නොගැළපීම තවදුරටත්**

**අයහපත් විය හැකිය.** සිව්වන කාර්මික විප්ලවය, කෘතිම බුද්ධිය, රොබෝ තාක්ෂණය, ස්වයංක්‍රියකරණය ආදී විප්ලවීය තාක්ෂණයන් එකතුවකින් සමන්විත වේ. මෙම තාක්ෂණ වර්ධනයත් සමඟ සාම්ප්‍රදායික වර්ගයේ රැකියා ස්වයංක්‍රීයකරණය මගින් ප්‍රතිස්ථාපනය විය හැකිය. මෙම නැගී එන අභියෝග සමඟ අනාගත රැකියා අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ශ්‍රම බලකාය සූදානම් කිරීම අවශ්‍ය වන අතර එය පාසැල් මට්ටමින් විෂය මාලා ප්‍රතිව්‍යුහගතකරණය මගින් ආරම්භ කළ යුතුය. තවද, වර්තමාන ශ්‍රම බලකාය ද ගෝලීය වශයෙන් සිදු වෙමින් පවතින වෙනස්කම් පිළිබඳව අවධානයෙන් පසුවීම අවශ්‍ය වන්නා සේම ඔවුන්ගේ රැකියා තුළ රැඳී සිටීමට හා ඒවා ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කුසලතා සංවර්ධනය කර ගැනීම හා අනුගත වීම අවශ්‍ය වේ. අනෙක් අතට, වෛද්‍ය, වයෝවෘද්ධ සහ ළමා යන රැකවරණ සැපයීම් සේවා වැනි මිනිසුන්ට පමණක් කළ හැකි සමහර රැකියා අවස්ථා ද ඇති අතර එවැනි රැකියා අවස්ථා සඳහා විදේශීය වශයෙන් මෙන්ම ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහන සංසිද්ධිය සමඟ අනාගතයේදී දේශීය වශයෙන් ද ඉල්ලුම ඉහළ යෑමේ ප්‍රවණතාවක් ඇති බැවින් එවැනි රැකියාවන්ට අවශ්‍ය කුසලතා ලබා දීම මගින් ශ්‍රම බලකාය ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය.

- **රැකියා සෙවීම සහ රැකියා උත්පාදනය පිළිබඳ පුද්ගලයන් අතර ඇති ආකල්ප වෙනස් කිරීමට නිසි පියවර ගත යුතුය.** රාජ්‍ය අංශයේ රැකියාවල පවතින ඉහළ රැකියා සුරක්ෂිතතාව හේතුවෙන් රාජ්‍ය අංශයේ රැකියා සෙවීමට තරුණ කාණ්ඩ අතර වැඩි ප්‍රවණතාවක් පවතී. එහෙයින් රාජ්‍ය අංශයේ රැකියා ලැබෙන තෙක් සමහර තරුණ තරුණියන් ආර්ථිකයට සක්‍රීයව දායක නොවී සිටීමට ඉඩ ඇති අතර එය රැකියාවක, අධ්‍යාපන හෝ පුහුණු කටයුත්තක නොයෙදෙන තරුණ කාණ්ඩයේ (NEET: Not in Employment, Education or Training) ඉහළ යෑමට ද හේතු වේ. මීට විකල්පයක් ලෙස, රැකියා අත්දැකීම් ලබා ගනු පිණිස තරුණ තරුණියන්ට පෞද්ගලික අංශයේ ආධුනිකත්ව පුහුණු වැඩසටහන්වලට සහභාගි විය හැකිය. තවද, මෙවැනි වැඩසටහන්වලට සහභාගි වී තිබීම රාජ්‍ය අංශයේ රැකියා ලබා දීමේ දී පූර්ව අවශ්‍යතාවක් බවට පත් කිරීමට සලකා බැලිය හැක. එපමණක් නොව, ශ්‍රී ලංකා ශ්‍රම වෙළඳපොළ පිළිබඳ පවත්නා පොදු විවේචනයක් නම් සේවා නියුක්තිකයන්ට තම සුදුසුකම් නිසි පරිදි රැකියා සඳහා යොදා ගැනීමට නොහැකි වීමයි. ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතා සහ අධ්‍යයන විෂයමාලාවන් අතර පවත්නා නොගැලපීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය හැකි අතර, එම විෂයමාලා වෙළඳපොළ අවශ්‍යතා අනුව නිසි පරිදි වෙනස් කිරීම ද අත්‍යවශ්‍ය වේ.

4